කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2019

2023 ජුනි

මානවශාස්ත්‍ර පීඨය

# සාහිත්‍ය විචාරය

## ග්‍රීක රෝම යුගයන්හි සාහිත්‍ය නිර්මාණ හා සෞන්දර්ය සංකල්ප අධ්‍යයනය

## LTCR 18214

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. "ග්‍රීසියෙහි භූගෝලීය හා සමාජ දේශපාලන පසුබිම, අනන්‍ය හා ස්වායත්ත ලක්ෂණවලින් හෙබියා වූ ශිෂ්ටාචාරයක් ප්‍රභවය වීම කෙරෙහි ප්‍රබලාකාරයෙන් බලපෑවේය." තත් ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව සනිදර්ශන ව පරීක්ෂා කරන්න.

02. "ග්‍රීක පෞර රාජ්‍යය අතර ස්ථාපිත ව පැවතියේ එක සමාන දේශපාලන යන්ත්‍රණයක් හෝ සංස්කෘතික සම්ප්‍රදායන් නොවේ." <u>ඇතැන්සය</u> හා <u>ස්පාටාව</u> කෙරෙහි මුඛ්‍යාවධානයෙන් තත් ප්‍රකාශයෙහි යුක්තියුක්තතාව විභාග කරන්න.

03. හෝමර්ගේ <u>ඉලියඩ්</u> (Iliad) කාව්‍යය වීර කාව්‍යයක් වශයෙන් අගය කළ හැක්කේ කවර හේතු සාධක නිසා දැයි සනිදර්ශන ව පහදන්න.

04. "<u>ඔඩිසියස්ට</u> (Odysseus) ස්වභාව ධර්මය ජය ගැනීමේ දී මුහුණ පෑමට සිදුවූ සන්ත්‍රාසදායී අවස්ථා ඉරණම නිසා සිදුවන්නකි." තත් මතයෙහි සත්‍යාසත්‍යතාව පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

05. පහත සඳහන් ග්‍රීක දාර්ශනිකයන් <u>දෙදෙනා</u> පිළිබඳ ව සමාලෝචන සපයන්න.

    අ) <u>සොක්‍රටීස්</u>

    ආ) <u>ප්ලේටෝ</u>

06. ඇරිස්ටෝටල් සිය <u>කාව්‍යශාස්ත්‍රය</u> (Poetics) කෘතියෙහි දී ශෝකෝත්පාදක නාට්‍යය උත්තම කලාංගය ලෙස හඳුන්වන්නේ කවර හෙයින් දැ යි විමසන්න.

    <u>නැතහොත්</u>

    <u>කාව්‍යශාස්ත්‍රයෙහි</u> සඳහන් පරිදි <u>කාව්‍යමය සත්‍යය</u> හා <u>ඓතිහාසික සත්‍යය</u> අතර පවත්නා වෙනස සනිදර්ශන ව පැහැදිලි කරන්න.

07. ග්‍රීක නාට්‍ය කලාවෙහි පවතින සුවිශේෂතා කවරේ දැ යි උදාහරණ ආශ්‍රයෙන් විභාග කරන්න.

08. කාව්‍ය නිර්මාණකරණය, කිවියා සහ අනුග්‍රාහකත්වය (Sponsorship) අරභයා රෝමානු කිවීන්ගේ නිරීක්ෂණ කවරේදැයි පරීක්ෂා කරන්න.

09. සාහිත්‍ය කලා නිර්මාණයට හා සේවනයට හොරස් ගෙන් සැපයෙන දායකත්වය පිළිබඳව කාව්‍යකරණ කලාව (Arts Poetica) ඇසුරින් සනිදර්ශන ව විභාග කරන්න.

10. "ලොංජයිනස් විසින් උත්කෘෂ්ටත්වය (Sublimity) කරා නැංවුණු කාව්‍යයක විද්‍යමාන ලක්ෂණ අරභයා සම්පාදිත නිර්දේශ අද්‍යතන සාහිත්‍යාංග විචාරයට ද භාවිත කළ හැකිය." මෙහි සත්‍යාසත්‍යතාව නිදර්ශනාත්මක ව පරීක්ෂා කරන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි.)

************************************